# රෝස මලක් කතා කරයි



dreamstime.

කේ.කේ බිනුකි අප්සරා

# රෝස මලක් කතා කරයි

මහාමායා ප්‍රාථමික විද්‍යාලය
4 ශ්‍රේණිය C

ISBN - 978-624-208-018-5

# පිදුම

ආදරයෙන් .....

අම්මාට, තාත්තාට , ගුරු දෙමාපියනට

සහ යහළුවන්ට

පුදමි.

පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි .

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 . 11 . 01

# - රෝස මලක් කතා කරයි -



මගේ නම රෝස මල. ඩේලියා, සමන්පිච්ච, ඉද්ද, කටරොළු යන මල් වර්ග මගේ නෑදෑයෝ වෙති. මගේ පාට රතු පාට ඒ වගේම කහ, රෝස, සුදු, කොළ කියන පාටෙනුත් රෝස මල් තියෙනවා. මගේ වටේටම නිදිකුම්බා මල් පිපිලා තියෙනවා.

මම හැමදාම එයාලත් එක්ක කතා කරනවා. ඔන්න ඉතින් එක දවසක් ගෙදර අයති මාමා එළියට ආවා. එයා ආවේ උදැල්ලකුත් කරේ තියාගෙන.



එයා ඇවිල්ලා මගේ වටේට තිබුණු නිදිකුම්බා ගස් කැපුවා. මට හරිම දුක හිතුණා. මම එදා මුළු දවසම ඇඬුවා.



මට දැන් යාළුවෝ නෑ... දැන් ඉතින් මම තනිවෙලා. මට දැන් කතා කරන්න කෙනෙකුත් නෑ..



ඔන්න ඉතින් එක දවසක් අර මාමා හොඳින් හැඳ පැළඳගෙන ගමනක් ගියා. එයා ආපසු ආවේ බර මල්ලක් අතේ තියාගෙන. ඊට පස්සේ ආපහු ගෙදරින් එළියට ආවා ඊට පස්සේ ආයේ මොකක් හරි දෙයක් මතක් වුණා වගේ ආපසු ගියා.



ටික වේලාවකින් එයා ආපහු ආවා. එයා ආවේ කොහොමද දන්නවද? හති දාගෙන, දාඩිය පෙරාගෙන. එයා ආවේ මල්ලක් අතේ තියාගෙන. ඊට පස්සේ ගෙට ගිහින් උදැල්ලකුත් කරේ තියාගෙන තවත් රෝස පැළයක් අරගෙන. මට දැන් ගොඩක් සතුටුයි. ඇයි දන්නවද?



මට දැන් ආයෙත් යහළුවෙක් ඉන්නවනේ අර මාමා රෝස පැළය සිටුවලා යන්න ගියා. මම ගොඩක් දවස් බලාගෙන හිටියා. ඔන්න ඉතින් ටික දවසකින් ඒ මල පිපුණා. ඒ මල මොන පාටද දන්නවද?



රෝස පාට රෝස මලක්. මම එයාට කතා කරලා '' ඔයා හරිම ලස්සනයි'' කියලා කිව්වා. ඒත් එයා මාත් එක්ක කතා කළේ නැහැ. ඉතින් මම '' ඇයි ඔයා මාත් එක්ක කතා කරන්නේ නැත්තේ '' කියලා ඇහුවා. '' එට ඔයා වගේ කැත මලක් එක්ක කතා කරන්න ඕනෑ නැහැ '' එයා කිව්වා. එයා මං හිතන්නේ ආඩම්බර රෝස මලක් මට හිතුනා. ඊළඟ දවසේ උදේම ඒ ගෙදර හිටපු ළමයා එළියට ආවා. එයා ආවේ අපි දිහාට.



එයා ගිහින් රෝස පාට රෝස මල කඩාගෙන ඒකේ පෙති කඩලා බිමට දැම්මා. හොඳ වෙලාවට අනිත් රෝස මල නම් එතන තිබුණ පඳුරක් අස්සේ හැංගුණා. ''දැක්ක නේද යහළුවනේ ආඩම්බර වුණාම වෙන විපාක. ඔයාලා නම් මෙහෙම වෙන්න එපා''



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023 . 11 . 01